# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2085/46 - 2018 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2018.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2014 අගෝස්තු මස 28 දිනැති අංක 1877/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ 2014.10.01 දිනැති අංක 1882/18, 2016.02.02 දිනැති අංක 1952/20 හා 2016.11.24 දිනැති අංක 1994/68 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධනය කරන ලද්දා වූ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට පහත සඳහන් සංශෝධනයන් එක් කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

01. 7.3.2.1 අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද

- I. 7.2.2.1 හි සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 06/2006 හි MN2 හෝ ඊට ඉහළ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධාරීන්
- II. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ සම්මත පාඨමාලාව - 1 කොටස සමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරීන් සහ
- III. පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ සැලසුම් ශිල්පීන්

02. 7.3.2.3 වෙනත්

- II. පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
- IV. සේවයේ ස්ථිර කර තිබීම.

03. 10.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

- I. සේවා ශ්‍රේණියේ 11 ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

04. 11.2 තෝරා ගනු ලබන ක්‍රමය

(අ) (ආ) හා (ඇ) නොවෙනස්ව පවතී.

ඉහත (ආ) සහ (ඇ) හි සඳහන් සම්මුඛ පරීක්ෂණය

| *පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය.* |
|---|---|---|
| 1. සේවා පළපුරුද්ද | 65 | අදාළ නොවේ |
| 2. කුසලතාවය | 30 | |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 100 | |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 අගෝස්තු මස 04 වැනි දින.

09 - 210

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.